සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province Department of Education, Southern Province

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## තෙවන වාර පරීක්ෂණය 2020
## Third Term Test - 2020

| 11 ශ්‍රේණිය Grade 11 | ඉතිහාසය - I | පැය එකයි One hour |
|---|---|---|

**සැලකිය යුතුයි :**

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80 ක් හිමි වේ.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති (i), (ii), (iii) හා (iv) පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- මෙම පත්‍රය සඳහා ලකුණු 80 ක් හිමි වේ.

---

01. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී මූලාශ්‍රයක් ලෙස වඩාත් වැදගත් වන්නේ,
(i) සෙල්ලිපි (ii) ජන කතා (iii) ශිලා මෙවලම් (iv) නිවාස වල නටඹුන්

02. වංසත්ථප්පකාසිනී කෘතිය රචනා කර ඇත්තේ,
(i) දීපවංශයේ අර්ථ විවරණය සඳහා ය. (ii) මෙරට ස්තූප ඉදිකිරීමේ ඉතිහාසය හැඳින්වීමට ය.
(iii) රජවරුන්ගේ සේවාව ඇගයීම සඳහා ය. (iv) මහාවංසයේ අර්ථ විවරණය සඳහා ය.

03. පහතින් දක්වා ඇති X තීරුව Y තීරුව හා ගැලපූ විට වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,

| X | | Y | |
|---|---|---|---|
| 1. | චීන මූලාශ්‍රය | A | මෙගස්තිනීස්ගේ 'ඉන්ඩිකා' |
| 2. | ඉංග්‍රීසි මූලාශ්‍රය | B | ඉබන්බතූතාගේ දේශාටන වාර්තා |
| 3. | ග්‍රීක මූලාශ්‍රය | C | බැල්දියස්ගේ 'ලංකා පුරාවෘත්තය' |
| 4. | අරාබි මූලාශ්‍රය | D | පාහියන් හිමිගේ වාර්තා |
| | | E | රොබට් නොක්ස්ගේ 'එදා හෙළදිව' |

(i) D, E, A, B (ii) D, C, A, B (iii) D, E, C, B (iv) D, B, C, A

04. පාහියන්ගල, බටදොඹලෙන වැනි ගල්ලෙන් වැදගත් වන්නේ ඒවා,
(i) පුරාණ බෞද්ධ ආරාම පැවතීම නිසා ය.
(ii) ගල් යුගයේ මානවයාගේ ජීවන රටාවට අදාල සාධක හමුවන නිසා ය.
(iii) බ්‍රාහ්මී අක්ෂර සහිත ලෙන් ලිපි දැකගත හැකි නිසා ය.
(iv) දෙවන නාගරීකරණ සමයේ ආරක්ෂිත ස්ථාන වීම නිසා ය.

05. ශ්‍රී ලංකාවේ පැවති පූර්ව ඓතිහාසික යුගය ඊට පෙර පැවති ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන් කර දැක්වීමට පදනම් වූ සාක්ෂියක් **නොවන්නේ,**
(i) ක්‍රමවත් සුසාන චාරිත්‍ර විධි (ii) ගල් මෙවලම් භාවිතය
(iii) පිලිස්සූ මැටි වළං භාවිතය (iv) යකඩ ලෝහ භාවිතය

06. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස පසු කාලයේ දී ගංගා නිම්නය තුළට අවතීර්ණ වන ආකාරය පිළිබඳ පැහැදිලි අදහසක් ඉදිරිපත් කර ඇත්තේ,
(i) කිරිඳි ඔය නිම්නයේ සිදුකර ඇති අධ්‍යයනයෙනි. (ii) දැදුරු ඔය නිම්නයේ සිදුකර ඇති අධ්‍යයනයෙනි.
(iii) මහවැලි ගංගා නිම්නයේ ඇති අධ්‍යයනයෙනි. (iv) වලවේ නිම්නයේ සිදුකර ඇති අධ්‍යයනයෙනි.

07. පහතින් දක්වා ඇති ඓතිහාසික සිදුවීම් පිළිබඳ කාල අනුපිළිවෙළ අනුව දක් වූ විට නිවැරදි පිළිතුර වන්නේ,
A - ගල්පොත සෙල්ලිපිය කරවීම
B - ථූපාරාමය ඉදිකරවීම
C - තම දසවන රාජ වර්ෂයේ දී ග්‍රාම සීමා ලකුණු කිරීම
D - රුවන්වැලි සෑය ඉදිකරවීම
E - තිලෝක සුන්දරී නම් කාලිංග කුමරිය විවාහ කර ගැනීම
(i) CBEDA (ii) BCAED (iii) ACEBD (iv) CBDEA

08. භෞතික විද්‍යාත්මක මූලධර්ම පිළිබඳ දැනුම පැරණි ලාංකිකයන් සතුව පැවති බව සනාථ කිරීමට ඉදිරිපත් කළ හැකි කරුණ වන්නේ,

(i) උඩරංචාමඩමේ මැටි බඳුන (ii) රංචාමඩමේ මැටි ඔරු සුසානය
(iii) දැදිගම ඇත් පහන (iv) සමනළ වැව යකඩ නිස්සාරණ උදුන

09. ''පෙර අපර දෙදිග රටවල ප්‍රජාව සමග සුහදශීලී හා විශ්වාසවන්ත ලෙස කටයුතු කිරීම මෙරට පැරණි රජවරුන්ගේ විදේශ ප්‍රතිපත්තියේ කැපී පෙනෙන ලක්ෂණයකි.'' මෙම ප්‍රකාශයට පටහැනි පිළිතුර වන්නේ,

(i) භාතිකාභය රජු රෝමය සමග තානාපති සබඳතා පැවැත්වීම.
(ii) VI වන අග්ගබෝධි රජ චීනය සමග රාජතාන්ත්‍රික සබඳතා පැවැත්වීම.
(iii) පළමුවන ගජබාහු රජු චේර රාජ්‍යයේ පත්තිනි දේවාලයක් විවෘත කිරීම.
(iv) පළමුවන පරාක්‍රමබාහු රජු වෙළඳ ගනුදෙනුවක් මුල්කරගෙන බුරුම දේශය ආක්‍රමණය කිරීම.

10. විමධ්‍යගත පාලන බලයක් භුක්ති විඳිමින් සිටි පරුමකවරුන්ගේ සහාය ලබාගැනීමෙන් මධ්‍යගත පාලනයක් ගොඩනැගූ පාලකයා වූයේ,

(i) I විජයබාහු රජු (ii) මහසෙන් රජු (iii) දුටුගැමුණු රජු (iv) වසභ රජු

11. පහත 'අ' තීරුවේ දැක්වෙන කරුණ 'ආ' තීරුවේ දැක්වෙන මිනුම් සමග ඇති සබඳතාවය අනුපිළිවෙල අනුව ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| ''අ'' | | ''ආ'' | |
|---|---|---|---|
| 1. | බර මැනීම | A | ගව්ව |
| 2. | අවකාශය මැනීම | B | ගුන්ජා |
| 3 | කාලය මැනීම | C | අමුණ |
| 4. | දිග දුර මැනීම | D | හවජර |

(i) BCDA (ii) BDCA (iii) CDAB (iv) CBAD

12. නිසි කාලයට සී සෑම නොකරන පුද්ගලයන්ට කලං පහක දඩයක් නියම කල නීතිය ඇතුළත් සෙල්ලිපිය වන්නේ,

(i) වෙස්සගිරිය (ii) කොණ්ඩවට්ටවාන් (iii) සිතුල්පව්ව (iv) බුද්ධන්නෙහෙළ

13. වර්ෂ 1796 දී ඉංග්‍රීසීන් මෙරට මුහුදුබඩ ප්‍රදේශ අල්ලා ගන්නා විට උඩරට සිටි රජතුමා වූයේ,

(i) දෙවන රාජසිංහ රජු (ii) කීර්ති ශ්‍රී රාජසිංහ රජු
(iii) ශ්‍රී විජය රාජසිංහ රජු (iv) රාජාධිරාජසිංහ රජු

14. පහත A, B, C හා D යටතේ දැක්වෙන ඓතිහාසික සිදුවීම් අතුරෙන් කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රාජ්‍ය සමයේ ජීවත් වූවෙකුට දැනගන්නට නොලැබෙන සිදුවීම් ඇතුළත් පිළිතුර කුමක් ද?

A I පරාක්‍රමබාහු රජු පරාක්‍රම සමුද්‍රය ඉදිකරවීම
B III විජයබාහු රජතුමා බෙලිගල දළදා මැදුරක් ඉදිකරවීම
C නිශ්ශංක අලකේෂ්වර කෝට්ටේ බලකොටුවක් ඉදිකරවීම
D මහා විජයබාහු රජු තිලෝකසුන්දරී කුමරිය විවාහ කර ගැනීම

(i) B හා C (ii) A හා B (iii) C හා D (iv) A හා D

15. අතීත සමාජයේ යම් අපරාධකරුවෙකු ගමක සැඟවී සිටින විට එම ගමෙහි ජනයා රජයට ගෙවිය යුතු බද්ද හැඳින්වූයේ,

(i) දකපති (ii) බොජකපති (iii) ගෘහදණ්ඩ (iv) මතරමජිබක

16. යාපන රාජධානියේ ආරම්භකයා ලෙස හඳුන්වනු ලබන්නේ,

(i) වික්කිරම (ii) විජය කුලංකෛ (iii) වරෝදය (iv) මාර්තාණ්ඩ

17. පුනරුද සමයේ ඉතාලියේ සිටි ප්‍රකට ගත්කරුවෙකු නොවූයේ,

(i) ඉරාස්මස් (ii) ඩාන්ටේ (iii) පෙට්රාක් (iv) බොකැෂියෝ

18. යුරෝපයේ පුනරුද සමයේ පැවති ක්ෂේත්‍ර කීපයක් හා සම්බන්ධ පුද්ගලයන්ගේ නම් ''අ'' තීරුවේ ද අදාල ක්ෂේත්‍ර ''ආ'' තීරුවේ ද දැක්වේ. තීරු දෙක නිවැරදිව ගැලපූ විට පිළිතුර වන්නේ,

| ''අ'' | | ''ආ'' | |
|---|---|---|---|
| 1. | ජොහැන්නස් ගුටන්බර්ග් | A | අවසාන විනිශ්චය |
| 2. | නිකලස් කොපර්නිකස් | B | පිලිපීනය |
| 3 | මයිකල් ආන්ජිලෝ | C | පෘතුවිය ගෝලාකාර බව |
| 4. | පර්ඩිනන්ඩ් මැගලන් | D | මොනාලිසා |
| | | E | මුද්‍රණ යන්ත්‍රය |

(i) ECDB (ii) EABC (iii) EDAC (iv) ECAB

19. කෝට්ටේ ධර්මපාල රජු තෑගි ඔප්පුවකින් තම රාජ්‍ය උරුමය පවරන ලද බටහිර ජාතිය වූයේ,
(i) ලන්දේසීන් (ii) ඉංග්‍රීසීන් (iii) පෘතුගීසීන් (iv) ප්‍රංශවරුන්

20. වර්ෂ 1766 දී ලන්දේසීන් සමග ගිවිසුමක් අත්සන් කරන ලද්දේ,
(i) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු (ii) ශ්‍රී විජය රාජසිංහ රජු
(iii) කීර්ති ශ්‍රී රාජසිංහ රජු (iv) පළමුවන විමලධර්මසූරිය රජු

- **පහතින් දක්වා ඇති නිපැයුම් අධ්‍යයනය කොට 21 සහ 22 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A වාෂ්ප එන්ජිම
B රෝලර් යන්ත්‍රය
C මියුල් යන්ත්‍රය
D ආරක්ෂක ලාම්පුව
E දුවන නඩාව
F යපස් උණු කිරීමේ විදුලි උදුන

21. ඉහත දක්වා ඇති නිපැයුම් අතුරින් යකඩ හා වානේ කර්මාන්තය හා සම්බන්ධ නිවැරදි පිළිතුර වන්නේ,
(i) B හා E (ii) A හා D (iii) A හා F (iv) B හා F

22. ඉහත දක්වා ඇති නිපැයුම් අතුරින් ගල් අඟුරු කර්මාන්තය හා සම්බන්ධ නිවැරදි පිළිතුර වන්නේ,
(i) C හා D (ii) A හා D (iii) A හා C (iv) D හා E

23. වර්ෂ 1803 දී ඉංග්‍රීසීන්ගේ ප්‍රථම උඩරට ආක්‍රමණය අසාර්ථක වීමට තුඩුදුන් හේතුවක් **නොවන්නේ,**
(i) කොළඹ සමග සන්නිවේදන පහසුකම් ඇනහිටීම.
(ii) වැසි සමය ආරම්භ වීම.
(iii) උඩරට රජතුමා ඉංග්‍රීසීන් සමග සාම ගිවිසුමක් අත්සන් කිරීම.
(iv) ඉංග්‍රීසි හමුදාව අතර ලෙඩ රෝග පැතිරයාම.

- **පහත සඳහන් වගුවේ A සිට I දක්වා තොරතුරු ඇසුරින් 24 හා 25 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| වර්ෂය | බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයෝ | ඓතිහාසික පුද්ගලයෝ |
|---|---|---|
| A 1848 | D ෆෙඩ්රික් නෝර්ත් | G ශ්‍රී වික්‍රම රාජසිංහ |
| B 1800 | E රොබට් බ්‍රවුන්රිග් | H ගොංගාලේගොඩ බණ්ඩා |
| C 1815 | F ටොරින්ටන් සාමි | I කැප්පෙටිපොල දිසාව |

24. බ්‍රිතාන්‍යයන් උඩරට යටත් කිරීම පිළිබඳ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?
(i) CEG (ii) BDI (iii) ADH (iv) BFI

25. බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව උඩරටියන් සිදුකළ නිදහස් අරගලයක් පිළිබඳ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?
(i) CFH (ii) ADI (iii) BFI (iv) AFH

26. පහත සඳහන් සිද්ධීන් ඓතිහාසික පිළිවෙළින් පෙළ ගැස්සූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.
A සීමිත ඡන්ද බලයෙන් ව්‍යවස්ථාදායක සභාවට උගත් ලාංකික නියෝජිතයෙකු පත් කිරීම.
B විධායක කාරක සභා පිහිටුවීම.
C දිවයින පළාත් පහකට බෙදීම.
D ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් සාමාජිකයන් අතරින් මහජන ඡන්දයෙන් පත් වූ පිරිස පැහැදිලි බහුතරය වීම.
(i) BCDA (ii) CADB (iii) ACBD (iv) DBAC

27. ඉන්දියානු ජාතික ව්‍යාපාරයේ ශ්‍රේෂ්ටතම නායකයා වූයේ,
(i) ජවහර්ලාල් නේරු තුමා (ii) බාල් ගාංගාධාර් තිලක් මහතා
(iii) මහත්මා ගාන්ධි තුමා (iv) සුරේන්ද්‍රනාත් බැනර්ජි මහතා

28. පහත සඳහන් ''අ'' තීරුව හා ''ආ'' තීරුව ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| ''අ'' | ''ආ'' |
|---|---|
| 1. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි | A මහාබෝධි සංගමය |
| 2. වලිසිංහ හරිස්චන්ද්‍ර තුමා | B කම්කරු ව්‍යාපාරය |
| 3 අනගාරික ධර්මපාල තුමා | C පංචමහා වාදය |
| 4. ඒ. ඊ. ගුණසිංහ මහතා | D අනුරාධපුරයේ පූජනීය ස්ථාන |

(i) CDAB (ii) CADB (iii) BCDA (iv) DCAB

29. ශ්‍රී ලංකාවේ තේ වගාව සිදුනොකරන දිස්ත්‍රික්කයක් වන්නේ,
(i) බදුල්ල (ii) නුවරඑළිය (iii) මාතලේ (iv) පුත්තලම

- **පහත A සිට E දක්වා ඇති තොරතුරු ඇසුරින් 30 හා 31 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය
B විධායක ජනාධිපති ධූරය
C ජාතික රාජ්‍ය සභාව
D අග්‍රාණ්ඩුකාර තනතුර
E සමානුපාතික නියෝජන ක්‍රමය

30. වර්ෂ 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමයට අදාල පිළිතුර වන්නේ,
(i) B හා C (ii) A හා D (iii) D හා E (iv) A හා B

31. 1978 දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාල පිළිතුර වන්නේ,
(i) B හා E (ii) A හා E (iii) D හා E (iv) C හා D

32. මෙරට ගොවි ජනපද ව්‍යාපාරයේ නිර්මාතෘවරයා ලෙස හඳුන්වන්නේ,
(i) ජේ. ආර්. ජයවර්ධන මහතා (ii) ජෝන් කොතලාවල මහතා
(iii) සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය (iv) ඩී. එස්. සේනානායක මහතා

33. ජාතික වැදගත්කමකින් යුතු කරුණක් සම්බන්ධයෙන් සෘජුවම මහජන මතය ලබාගන්නා ක්‍රමය වන්නේ,
(i) පළාත් සභා මැතිවරණය (ii) පාර්ලිමේන්තු මැතිවරණය
(iii) පළාත් පාලන මැතිවරණය (iv) ජනමත විචාරණය

34. මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ ඉදිකරන ලද ජලාශයක් නොවන්නේ,
(i) කොත්මලේ (ii) ගල්ඔය (iii) වික්ටෝරියා (iv) රන්දෙණිගල

35. මෙරටේ නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ලද්දේ,
(i) එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා (ii) ඩී. එස්. සේනානායක මහතා
(iii) සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතා (iv) ඩඩ්ලි සේනානායක මහතා

- **පහත A හා B ප්‍රකාශ කියවා 36 සහ 37 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
  - A නියෝජනයක් නැතිනම් බදුත් නැත
  - B සාමය, ඉඩම් හා ආහාර

36. ඇමරිකානු නිදහස් සටන හා සම්බන්ධයෙන්
(i) A අසත්‍ය වන අතර B සත්‍ය වේ. (ii) B අසත්‍ය වන අතර A සත්‍ය වේ.
(iii) A හා B අසත්‍ය වේ. (iv) A හා B සත්‍ය වේ.

37. රුසියානු විප්ලවය හා සම්බන්ධයෙන්
(i) B අසත්‍ය වන අතර A සත්‍ය වේ. (ii) A හා B සත්‍ය වේ.
(iii) A හා B අසත්‍ය වේ. (iv) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

- **පහත A හා B යටතේ දක්වා ඇති තොරතුරු ඇසුරෙන් 38 හා 39 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A සරයෝවෝ සිද්ධිය
B මුසෝලිනිගේ ක්‍රියාකලාපය

38. පළමු ලෝක මහා සංග්‍රාමය සම්බන්ධයෙන්
(i) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (ii) A හා B සත්‍ය වේ.
(iii) A අසත්‍ය වන අතර B සත්‍ය වේ. (iv) A හා B අසත්‍ය වේ.

39. දෙවන ලෝක මහා සංග්‍රාමය සම්බන්ධයෙන්
(i) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (ii) A හා B අසත්‍ය වේ.
(iii) A අසත්‍ය වන අතර B සත්‍ය වේ. (iv) A හා B සත්‍ය වේ.

40. එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් ආරක්ෂක මණ්ඩලයට අයත් කාර්යයක් වන්නේ,
(i) සාමාජික රටවලින් සාමාජික ගාස්තු අය කිරීම.
(ii) සාමාජික රටවල මතුවන ගැටලුවලට නීති උපදෙස් ලබාදීම.
(iii) ජාත්‍යන්තර අධිකරණයට විනිසුරුවරුන් පත් කිරීම.
(iv) ආක්‍රමණිකයන්ට එරෙහිව ආර්ථික සම්බාධක පැනවීම.

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## Department of Education, Southern Province

**තෙවන වාර පරීක්ෂණය 2020**
**Third Term Test - 2020**

| | | |
|---|---|---|
| **11 ශ්‍රේණිය**<br>**Grade 11** | **ඉතිහාසය - II** | **පැය තුනයි**<br>**Three hours** |

සැලකිය යුතුයි.

- **I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **II කොටසේ ප්‍රශ්න හතරකට ද, III කොටසේ එක් ප්‍රශ්නයකට ද පිළිතුරු සපයන්න.**
  **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.**

---

### I - කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) කදම්බ නදිය, මහනුවර, ගෝකණ්ණතිත්ථ, මින්නේරිය වැව, රංචාමඩම, මහාවාලුකාගාම, මඩකලපුව, කල්පිටිය, නාච්චදූව වැව, වලවේ ගඟ, පාහියන්ගල, යාපනය (ලකුණු 12)

(ii) ගෝව, රතු මුහුද, ලන්ඩන්, ඇෆ්ගනිස්ථානය, සුභ පැතීමේ තුඩුව, චීනය (ලකුණු 06)

(ආ) (i) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික කරුණු හා සම්බන්ධ පුද්ගලයන් හා ඓතිහාසික මූලාශ්‍ර අනුපිළිවෙලින් සඳහන් කරන්න.

A අශ්ව හිස සහ මිනිසා දැක්වෙන මූර්තිය පිහිටි ස්ථානය

B උඩරට අවසාන සිංහල රජතුමා

C කුඩා රාජ්‍ය එක්කොට ජර්මනිය බිහිකළ නායකයා

D ක්‍රි.ව. 1800 දී දකුණු අප්‍රිකාවේ මුලින්ම නිපදවූ පොහොර වර්ගය (ලකුණු 04)

(ii) 1. A මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?

2. මෙය හමු වූ ප්‍රදේශය හඳුන්වන්න.

3. මෙය අයත් වන්නේ කිනම් යුගයකට ද?

4. මෙය නිපදවීමට යොදාගත් යන්ත්‍රය කුමක් ද?

(ලකුණු 04)


A

(iii) 1. B රූපයේ සිටින්නේ කවරෙකු ද?

2. මෙතුමාගේ රාජධානිය කුමක් ද?

3. මෙතුමා කිනම් වංශයකට අයත් වූයේ ද?

4. මෙතුමා පිටුවහල් කළ ප්‍රදේශය කුමක් ද?

(ලකුණු 04)


B

## II - කොටස

(02) (i) අර්ධ ශුෂ්ක කලාපයට අයත් ගල් යුගයේ මානව සාක්ෂි හමු වූ ස්ථාන තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) A, B, C හා D වලින් අතීතයේ විවිධ වෘත්තීන්හි නිරත වූ අය පිළිබඳව සඳහන් කර ඇත. ඔවුන් විසූ ගම් පිළිවෙලින් හඳුන්වන්න.

A - වළං සාදන්නන් විසූ ගම්

B - ගොවියන් විසූ ගම්

C - ධීවරයන් විසූ ගම්

D - ගොපල්ලන් විසූ ගම් (ලකුණු 04)

(iii) ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ආහාර රටාවේ ප්‍රධාන ලක්ෂණ දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) පුරාණ කාලයේ මෙරට පැවති දියුණු කර්මාන්ත තුනක් නම් කර ඉන් කර්මාන්ත දෙකක් පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 06)

(03) (i) පහත සඳහන් A, B හා C ට අයත් ඓතිහාසික තොරතුරට අදාල ස්ථාන නම් කරන්න.

A ස්වභාවික සුළං බලයෙන් ක්‍රියාකළ යකඩ නිස්සාරන උදුන හමු වූ ප්‍රදේශය

B නානාදේසී වෙළඳ සංවිධානයට අයත් ලෝහ මුද්‍රාව හමු වූ ප්‍රදේශය

C සංඝමිත්තා තෙරණිය ශ්‍රී මහා බෝධිය රැගෙන පැමිණි නැව් තොට (ලකුණු 03)

(ii) පහත සඳහන් A, B, C හා D ට අයත් කරුණට අදාල පිළිතුර වරහන තුළින් තෝරා ලියන්න.

(වේවැල්කැටිය සෙල්ලිපිය, ඌරුසිටා ළිං, කිරිමඩු ශාන්තිකර්මය, ගොඩවාය සෙල්ලිපිය, වෙස්සගිරිය සෙල්ලිපිය, ඌරාකැට ළිං, ශිව ශාන්තිකර්මය)

A වරායකින් අයකළ රේගු බදු විහාරයකට පූජා කිරීම

B ගවයින්ගේ ආරක්ෂාව සඳහා සිදුකළ ශාන්තිකර්මය

C සිදුකළ අපරාධ සම්බන්ධයෙන් දියයුතු දඬුවම් සඳහන් වීම

D ජලයෙහි කිවුල් ස්වභාවය අවම කිරීමට සෑදූ ළිං (ලකුණු 04)

(iii) හතරවන උදය රජු විසින් පිහිට වූ සොරබොර වැව ටැම් ලිපියේ සඳහන් වෙළඳ නීති තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05)

(iv) ලාංකීය ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ පාලකයෙකු වන මහා විජයබාහු රජුගේ සේවාවන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 06)

(04) (i) මෙරට වාරි ඉංජිනේරුවන්ගේ විශිෂ්ඨ නිර්මාණයක් වූ වැවක ප්‍රධාන අංග තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත සඳහන් A, B, C හා D ට අදාල පිළිතුර වරහන තුළින් තෝරා ලියන්න.

(අමණ්ඩගාමිණී අභය රජු, දුටුගැමුණු රජු, භාණකවරු, අන්තේවාසික, පළමුවන උපතිස්ස රජු, හතරවන මහින්ද රජු, නිශ්ශංකමල්ල රජු)

A හේන් වගාවට පැන වූ බදු අහෝසි කිරීම.

B ගැබිනි මව්වරුන් සඳහා පසවන්තිනාම සාලා ඉදිකරවීම

C ධර්මය මතක තබාගත් භික්ෂූන්වහන්සේලා

D ප්‍රථමවරට ලක්දිව එක්සේසත් කිරීම (ලකුණු 04)

(iii) සීතාවක රාජධානිය බිඳවැටීමට බලපෑ හේතු තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) ''සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය කෝට්ටේ යුගයයි.'' මෙම කියමන කරුණු දෙකක් මගින් විස්තර කරන්න. (ලකුණු 06)

(05) (i) ඉංග්‍රීසීන් මෙරට මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කර ගැනීමට පෙර උඩරට රාජ්‍යයට පැමිණි ඔවුන්ගේ දූතයන් තිදෙනා නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත සඳහන් A, B, C හා D ට අදාළ පිළිතුර වරහන තුළින් තෝරා ලියන්න.

(ආරුමුග නාවලර්, රොබට් බ්‍රවුන්රිග්, හජ්ජි මරික්කාර්, පොන්නම්බලම් රාමනාදන්, ෆෙඩ්රික් නොර්ත්, සිද්දි ලෙබ්බෙ, ඔරාබි පාෂා)

A මුහුදුබඩ ප්‍රදේශයට පත්කළ පළමු ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා

B මඩිගෙ මුහන්දිරම් තනතුරට පත්කළ මුස්ලිම් ජාතිකයා

C උදයභානු පුවත්පත ආරම්භ කිරීම

D කොළඹ සහිරා විද්‍යාලය ආරම්භ කිරීම (ලකුණු 04)

(iii) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමාගේ සේවාවන් තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) A වර්ෂ 1848 දෙවන නිදහස් සටනේ නායකයින් දෙදෙනෙකු ද

B ඉහත නිදහස් සටනට තුඩුදුන් හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 06)

(06) (i) පහත සඳහන් A, B හා C ට අදාල පුද්ගලයින් නම් කරන්න.

A ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා

B ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් අවශ්‍ය බවට විධිමත් පෙත්සමක් ඉදිරිපත් කළ ලාංකිකයා

C වතු කම්කරුවන්ගේ පළමු වෘත්තීය සමිති නායකයා (ලකුණු 03)

(ii) වර්ෂ 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණයන්හි පරිපාලන ප්‍රතිසංස්කරණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) වර්ෂ 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ කැපීපෙනෙන ලක්ෂණ තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) බ්‍රිතාන්‍ය පාලනය නිසා මෙරටට උරුම වූ යහපත් අංග දෙකක් හා අයහපත් අංග එකක් විස්තර කරන්න. (ලකුණු 06)

(07) (i) පහත සඳහන් තනතුරුවලට අදාල පුද්ගලයින් නම් කරන්න.

A ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනාධිපතිවරයා

B ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැතිවරිය

C ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපතිවරයා (ලකුණු 03)

(ii) සෝල්බරි ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) පසුගිය දශකය තුළ මෙරට වී වගාව දියුණු කිරීම සඳහා රජය ගෙන ඇති පියවර දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) 1978 දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන අංග තුනක් සඳහන් කර ඉන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 06)

## III - කොටස

(08) (i) පහත සඳහන් නව නිපැයුම් හා සම්බන්ධ පුද්ගලයින් නම් කරන්න.

A - රූපවාහිනිය

B - ගුවන්විදුලිය

C - ගුවන්යානය (ලකුණු 03)

(ii) පෙරදිග රටවලින් හා ඇමරිකා මහාද්වීපයෙන් යුරෝපයට ගෙන ගිය වෙළඳ ද්‍රව්‍ය හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) පුනරුදය ඇතිවීමට බලපෑ හේතු තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) පුනරුදය ලංකාව කෙරෙහි සිදුකරන ලද බලපෑම කරුණු දෙකක් මගින් විස්තර කරන්න. (ලකුණු 06)

(09) (i) පහත සඳහන් කරුණට අදාල වන විප්ලවය සඳහන් කරන්න.

A බොස්ටන් තේ සාදය

B බැස්ටිල් බන්ධනාගාරය

C ''මේ අවස්ථාවේ අපි බලය අල්ලා නොගත හොත් ඉතිහාසය අපට සමාව නොදෙනු ඇතැයි'' (ලකුණු 03)

(ii) පහත සඳහන් තොරතුරුවලට අදාල පිළිතුරු වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් දක්වන්න.

(ජර්මනිය, දෙවන විලියම්, ජපානය, අබ්දුල් ගමාල් නසාර්, ඉතාලිය, ජවහර්ලාල් නේරු, ඔටෝ වෝන් බිස්මාර්ක්, ප්‍රංශය)

A - පළමු ලෝක යුද්ධයේ දී රහස් ගිවිසුමකින් මිත්‍ර පිලට එක් වූ රට

B - යටත් විජිත පිහිටුවීමට උනන්දු වූ ජර්මන් අධිරාජයා

C - නොබැඳි ජාතීන්ගේ සංගමය පිහිටවීමේ පුරෝගාමී නායකයා


D - දෙවන ලෝක යුධ සමයේ ලංකාවට බෝම්බ හෙලූ ආසියාතික රට (ලකුණු 04)

(iii) ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) A පළමුවන ලෝක යුද්ධයේ ප්‍රතිඵල දෙකක් ද

B දෙවන ලෝක යුද්ධයේ ප්‍රතිඵල එකක් ද විස්තර කරන්න. (ලකුණු 06)

(01) (අ) (i)
(01) (*a*) (i)
(01) (அ) (i)



(01) (අ) (ii)
(01) (*a*) (ii)
(01) (அ) (ii)



**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **තෙවන වාර පරීක්ෂණය 2020**


**11 ශ්‍රේණිය** **පිළිතුරු පත්‍රය - I පත්‍රය** **ඉතිහාසය**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(4) | 3 -(1) | 4 -(2) | 5 -(2) | 6 -(1) | 7 -(4) | 8 -(3) | 9 -(4) | 10 -(3) |
| 11-(1) | 12 -(2) | 13 -(4) | 14 -(1) | 15 -(3) | 16 -(2) | 17 -(1) | 18 -(4) | 19 -(3) | 20 -(3) |
| 21-(4) | 22 -(2) | 23 -(3) | 24 -(1) | 25 -(4) | 26 -(2) | 27 -(3) | 28 -(1) | 29 -(4) | 30 -(2) |
| 31-(1) | 32 -(4) | 33 -(4) | 34 -(2) | 35 -(3) | 36 -(2) | 37 -(4) | 38 -(1) | 39 -(3) | 40 -(4) |


(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

**II පත්‍රය - I කොටස**

(01) (අ) (i)




(ii)



(ආ) (i) A ඉසුරුමුනි විහාරය B ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ
C ඔටෝ වෝන් බිස්මාර්ක් D ගුවානෝ

(ii) 1. පින්තාරු කළ මැටි බඳුන / මැටි බඳුන
2. උඩරංචාමඩම
3. පූර්ව ඓතිහාසික යුගය
4. සකපෝරුව (ලකුණු 04)

(iii) 1. ශ්‍රී වික්‍රම රාජසිංහ
2. මහනුවර / උඩරට
3. නායක්කර්
4. වෙල්ලෝරය (ලකුණු 04)

## II - කොටස

(02) (i) බූන්දල, මිනිහාගල්කන්ද, අලුගල්ගේ, පතිරාජවෙල (ලකුණු $1 \times 3 = 03$)

(ii) A කුම්බකාරගාම B කසීකාරගාම C කේවට්ටගාම
D ගෝපාලගාම (ලකුණු $1 \times 4 = 04$)

(iii) * දඩයම් කරන ලද සතුන් උදා- .............
* ශාකමය ආහාර උදා- ...............
* ගොළුබෙල්ලන්, ගස්බෙල්ලන්, මිරිදිය මාළු ....... (විස්තරයට අනුව ලකුණු 05)

(iv) ලෝහ / රන් / ඇත්දත් කැටයම් / වළං / පේෂ / මැණික් ......
කර්මාන්ත හා මූලාශ්‍ර සහිත විස්තරය (කර්මාන්ත තුනට ලකුණු 03 යි. විස්තරයට ලකුණු 03 යි.)

(03) (i) A සමනළ වැව B හම්බන්තොට C දඹකොල පටුන / ජම්බුකෝලපට්ටන

(ii) A ගොඩවාය සෙල්ලිපිය B කිරිමඩු ශාන්තිකර්මය
C වේවැල්කැටිය සෙල්ලිපිය D ඌරාකැට ළිං (ලකුණු $1 \times 4 = 04$)

(iii) * වෙළඳපොලට පැමිණෙන කරත්තවලින් මිස වෙළඳ පොල පසුකරගෙන යන කරත්තවලින් බදු අය නොකළ යුතු බව
* බුලත් වෙළඳාම් කිරීමේ දී හිරු එළියෙන් ආවරණය වන මඩු තුළ පමණක් වෙළඳාම් කිරීම
* පොහොය දිනවල වෙළඳාම් කිරීම තහනම් බව
(කරුණු තුනට ලකුණු 03 යි. විස්තරයට ලකුණු 02 යි.)

(iv) * දැඩි අභියෝග මැද රජරට සිටි සොලීන් පැරදවීම
* පොළොන්නරුව තම රාජධානිය කර ගැනීම
* වෙහෙර විහාර / වැව් අමුණු ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය
* කාලිංග හා පාණ්ඩ්‍ය රාජ්‍ය සමග විවාහ සබඳතා
(විස්තරය අනුව ලකුණු දීම) (ලකුණු $3 + 2 = 06$)

(04) (i) වැව් බැම්ම / සොරොව්ව / රළපනාව / පිටවාන / මඩ සොරොව්ව..... (ලකුණු $1 \times 3 = 03$)

(ii) A නිශ්ශංකමල්ල රජු B I උපතිස්ස රජු
C භාණකවරු D දුටුගැමුණු රජු (ලකුණු $1 \times 4 = 04$)

(iii) * සීතාවක පාලකයන් නිරන්තර යුද්ධවල නියැලීම
* I රාජසිංහ රජුගේ බෞද්ධ විරෝධී ප්‍රතිපත්තිය
* I රාජසිංහ තමාට උදව් කළ වීරසුන්දර බණ්ඩාර මැරවීම නිසා උඩරට වැසියන් සහාය නොදීම
* I රාජසිංහගෙන් පසු රාජ්‍ය උරුමකරුවෙකු නොසිටීම
(කරුණු තුනට ලකුණු 03 යි. විස්තරයට ලකුණු 02 යි.)

(iv) * උගත් පඬිවරුන් උදා- .............
* බෞද්ධ අධ්‍යාපන ආයතන උදා- ............
* රචනා වූ සාහිත්‍ය කෘති හා සංදේශ කාව්‍ය උදා - ........ (විස්තරය අනුව ලකුණු දීම) (ලකුණු $3 + 2 = 06$)

(05) (i) ජෝන් පයිබස්, හියු බොයිඩ්, රොබට් ඇන්ඩෲස් (ලකුණු $1 \times 3 = 03$)

(ii) A ෆෙඩ්රික් නෝර්ත් B හජ්ජි මරික්කාර්
C ආරුමුග නාවලර් D සිද්දි ලෙබ්බෙ (ලකුණු $1 \times 4 = 04$)

(iii) * වර්ෂ 1880 දී පරම විඥානාර්ථ සමාගම පිහිටුවීම
* බෞද්ධ පාසල් ඇඹීම උදා-......
* ඉරුදින දහම් පාසල් ඇරඹීම
* වෙසක් පෝය නිවාඩු දිනයක් කිරීම (කරුණු තුනට ලකුණු 03 යි. විස්තරයට ලකුණු 02 යි.)

(iv) A පුරන්අප්පු, ගොංගාලේගොඩ බණ්ඩා, ඩිංගිරාල ...... (ලකුණු 1 x 2 = 02)

B
* රජයේ ඉඩම් ප්‍රතිපත්තිය
* ගම්සභාව අඩපන කිරීම
* නව අධිකරණ ක්‍රමය
* රජයේ නව බදු ප්‍රතිපත්තිය ...... (ලකුණු 2 x 2 = 04)

(06) (i) A පොන්නම්බලම් රාමනාදන්

B ජේම්ස් පීරිස්

C නඩේසන් අයියර් (ලකුණු 1 x 3 = 03)

(ii)
* ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම
* උඩරට හා පහතරට ඒකාබද්ධ කිරීම
* දිවයින පළාත් පහකට බෙදීම (ලකුණු 2 x 2 = 04)

(iii)
* රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම
* සර්වජන ඡන්දබලය ලැබීම
* විධායක කාරක සභා පිහිටුවීම (කරුණු තුනට ලකුණු 03 යි. විස්තරයට ලකුණු 02 යි.)

(iv) <u>යහපත් අංග</u>
* ජාත්‍යන්තර භාෂාවක් වන ඉංග්‍රීසි භාෂා දැනුම රට තුළ පැතිරීම
* ගමනාගමන / සන්නිවේදන / අධ්‍යාපන / සෞඛ්‍ය දියුණුව
* පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය
* අපනයන වැවිලි භෝග හඳුන්වා දීම (ලකුණු 2 x 2 = 04)

<u>අයහපත් අංග</u>
* මද්‍යසාර භාවිතය රට පුරා ව්‍යාප්ත වීම
* දේශීය සංස්කෘතිය පිරිහීම හා බටහිර සංස්කෘතිය පැතිරීම
* ඉඩම් අහිමි ජනතාවක් බිහිවීම (ලකුණු 2 x 1 = 02)

07 (i) A විලියම් ගොපල්ලව

B සිරිමාවෝ බණ්ඩාරනායක

C ජේ. ආර්. ජයවර්ධන (ලකුණු 1 x 3 = 03)

(ii)
* අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලය
* ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව
* අග්‍රාණ්ඩුකාරවරයා
* අධිකරණය (ලකුණු 1 x 4 = 04)

(iii)
* වී සඳහා සහතික මිල ක්‍රමයක් හඳුන්වාදීම
* පොහොර සහනාධාර ලබාදීම
* වී පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවීම (උදා- හිඟුරක්ගොඩ, මහඉලුප්පල්ලම, අම්බලන්තොට)
* ගොවි ණය ලබාදීම ..... (කරුණු දෙකට ලකුණු 02 යි. විස්තරයට ලකුණු 03 යි.)

(iv)
* විධායක ජනාධිපති ධුරය
* මූලික අයිතවාසිකම්
* පාර්ලිමේන්තුව
* අධිකරණය
* ඡන්ද විමසීම් ක්‍රම උදා-..... (ප්‍රධාන අංග තුනට ලකුණු 03 යි. විස්තරයට ලකුණු 03 යි.)

## III කොටස

08 (i) A ජෝන් ලෙගී බෙයාර්ඩ්

B ගුග්ලි මාර්කෝනි

C රයිට් සහෝදරයෝ (ලකුණු 1 x 3 = 03)

(ii) කුළුබඩු, රන්, රිදී, මුතු, මැණික්, ඇතුන්, ඇත්දළ (ලකුණු 1 x 4 = 04)

(iii)
* කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කිවරු යටත් කර ගැනීම
* වෙළඳාම දියුණු වීම හා නව ධනවතුන් පිරිසක් බිහිවීම
* බුද්ධි ප්‍රබෝධය
* පල්ලියේ ආධිපත්‍ය විවේචනය වීම (හේතු තුනට ලකුණු 03 යි. විස්තරයට ලකුණු 02 යි.)

(iv) * දේශපාලන වෙනස්කම්
ලංකාව යටත් විජිතයක් වීම, පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය, රෝම ලන්දේසි නීතිය
* ආර්ථික වෙනස්කම්
වාණිජ බෝග වගාව, ස්වයංපෝෂිත අර්ථක්‍රමය බිඳවැටීම, ආනයන අපනයන ආර්ථිකය, ගමනාගමනය, මුදල් භාවිතය, වෙළඳ නගර
* සමාජ වෙනස්කම් උදා- රෝමානු කතෝලික ආගම... (විස්තරය අනුව ලකුණු දීම)

(09) (i) A ඇමරිකන් විප්ලවය
B ප්‍රංශ විප්ලවය
C රුසියන් විප්ලවය (ලකුණු 1 x 3 = 03)

(ii) A ඉතාලිය B දෙවන විලියම් රජු
C ජවහල්ලාල් නේරු D ජපානය (ලකුණු 1 x 4 = 04)

(iii) * ආර්ථික සම්බාධක පැනවීම
* න්‍යෂ්ටික අවි තැනීම සීමා කිරීම හා පාලනය කිරීම සඳහා කටයුතු කිරීම
* සාම සාධක හමුදාව යෙදවීම
(කරුණු දෙකට හා විස්තරය අනුව ලකුණු දීම ලකුණු 02, විස්තරයට ලකුණු 02)

(iv) A ලෝක යුද්ධයේ ප්‍රතිඵල
* මධ්‍ය බලවතුන් පරාජය වී මිත්‍ර බලවතුන් ජය ගැනීම
* අති විශාල ජීවිත හා දේපල අහිමි වීම
* ඒකාධිපති රාජාණ්ඩු බිඳ වැටීම උදා-....
* නිදහස් රාජ්‍ය බිහිවීම උදා - ......
* ලෝක සාමය උදෙසා ජාතීන්ගේ සංගමය බිහිවීම


B ලෝක යුද්ධයේ ප්‍රතිඵල
* අක්ෂ පිල පරදවා මිත්‍ර පිල ජය ගැනීම
* අති විශාල ජීවිත හා දේපල අහිමි වීම
* යුදෙව් ජාතිකයින් මිලියන ගණනක් විනාශ කිරීම
* ජපානයට පරමාණු බෝම්බ හෙළීම
* මාෂල් සැලැස්ම ක්‍රියාත්මක වීම
* ලොව ධනවාදී හා සමාජවාදී පිල් දෙකක් නිර්මාණය වීම
* එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහිවීම
(විස්තරය අනුව A ට ලකුණු 04 යි. B ට ලකුණු 02 යි.)


අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට


www.lol.lk
Learn Ordinary Level


LOL.lk online Book Store


අමතන්න - 071 777 4440/0756999990/071 8540371




































Online shopping
www.lol.lk
Learn Ordinary Level
DELIVERY ISLANDWIDE
SECURE PAYMENT

# LOL.lk
online Book Store
071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්














## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්

















## කෙටි සටහන් පොත්




මිලට ගැනීමට සහ ඇණවුම් කිරීමට
**www.lol.lk**
**Learn Ordinary Level**
අමතන්න - 071 777 4440/0756999990/071 8540371

# PAST PAPERS WIKI

## ප්‍රශ්නපත්‍ර පොත් ගෙදරටම ගෙන්වා ගන්න ඔන්ලයින් ඕඩර් කරන්න

## WWW.LOL.LK වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal VISA MasterCard DISCOVER
NO PAYPAL ACCOUNT NEEDED!

# ONLINE BOOK STORE

An evening of fun for young readers

